# සිදත්සඟරා විචාර ග්‍රන්ථ පිළිබඳ සමාජ වාග්විද්‍යාත්මක අධ්‍යයනයක්

*A. I. Divakara*

**Abstract**

Mainly two versions of literary criticism texts can be cited that take into discourse *Sidath Sangarawa*. One version of literary criticism texts is inclusive of free verses and *Sannas* while the other version excludes free verses and *Sannas* in its criticism. When studying these literary criticism texts in relation to the grammatical principles presented in *Sidath Sangarawa*, three main factors are discernible which have a crucial importance in terms language planning nuances Standardization of the grammatical recommendations presented by the author of *Sidath Sangarawa*, creation of certain exceptions for the respective grammatical regulations, summing up of new rules in relation with the grammatical phenomenon presented by the author, modification of the existing grammatical rules and preparation of the groundwork for the compilation of new grammatical books are the noticeable factors that are visible in this regard.

JOURNAL OF THE FACULTY OF HUMANITIES -32

***Keywords :*** Sociolinguistic, Companion books to Sidathsangarawa, Language Planning, Standardisation, Recommended.

## 1. හැඳින්වීම

සමාජ අවශ්‍යතා විෂය කොටගෙන සිංහල භාෂාවේ ව්‍යාකරණ ප්‍රයෝග ඉගෙන ගැනීමේ අවශ්‍යතා ප්‍රබල ව දැනී ඇති එක් අවස්ථාවක් වශයෙන් දහනව වන හා විසි වන සියවස් දැක්විය හැකි ය. සිදත්සඟරාවේ ඇතැම් ව්‍යාකරණ රීති සිංහල භාෂාවේ ව්‍යාකරණ රීතිවලට නොගැළපීමත්, සමකාලීන ව්‍යවහාර අවශ්‍යතා පැන නැගී ඇති බැවිනුත් ඒ වෙනුවෙන් සිදත්සඟරාව අධ්‍යයනය කිරීමටත් එහි ව්‍යාකරණ රීති ඉගෙන ගැනීමටත් සිදත්සඟරාවට විචාර ග්‍රන්ථ සැකසීමටත් නව ව්‍යාකරණ කෘති සම්පාදනය කිරීමටත් පෙළඹී ඇති බවක් හඳුනාගත හැකි ය. සිදත්සඟරාව විෂයෙහි සංස්කරණ, සන්න ග්‍රන්ථ හා වෙනත් පරිවාර ග්‍රන්ථ බහුල ව සම්පාදනය වී ඇත්තේ ද පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි පාලන සමයන්හි දී සමාජ පරිහාණි අවදියක, එනම් දඹදෙණි යුගයේ දී මෙන් ම සිංහල භාෂාව පිළිබඳ ප්‍රාමාණික දැනුමින් යුත් වියත් ඌනතාව මෙන් ම ව්‍යාකරණ ග්‍රන්ථ ද දුර්ලභ වූ අවස්ථාවක දී සරණංකර සංඝරාජ හිමි ඇතුළු ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවේ අධ්‍යයන ක්‍රියාවලියත් සමඟ යි. විදේශීය බලපෑම් හමුවේ වියතුන්ට පෙනී ගොස් ඇති වැදගත් කරුණු කිහිපයක් සිදත්සඟරාව ආශ්‍රයෙන් ගොඩනැගිය හැකි ය. ඒ සිංහල ජාතියේ ස්වෛරී බව, අනන්‍යතාව, ආරක්ෂාව භාෂාව හා ව්‍යාකරණය සමඟ බැඳී පවතින බව, විවිධ පරිණාමීය ධර්මතාවලට හසු වුව ද භාෂාවේ පැවැත්ම ව්‍යාකරණ සංස්ථිතිය මත රඳා පවතින බව හා භාෂාවේ ආරක්ෂාව ස්වභාෂිකයන්ට ඉගැන්වීම මත රැක ගත හැකි බව ය. මෙහි ප්‍රතිඵලය වූයේ අධ්‍යයන ග්‍රන්ථයක් වශයෙන් සිදත්සඟරාව සමාජ සම්මතකරණයට දීර්ඝකාලීන ව හසු වීම යි.

ඒ අතර මේ අධ්‍යයනයේ දී අවධානය යොමුවන්නේ සිදත්සඟරා විචාර ග්‍රන්ථ පිළිබඳ ව පමණි. ඊට සිදත්සඟරා සන්න, ව්‍යාඛ්‍යාන, විමර්ශන, විචාර ආදි ග්‍රන්ථ ඇතුළත් වෙයි. සිදත්සඟරාව මූලාශ්‍රය කරගෙන බිහි ව ඇති විචාර ග්‍රන්ථවල ප්‍රධාන ස්වරූප දෙකක් හඳුනාගත හැකි ය. පෙළ හා සන්න සහිත විචාර ග්‍රන්ථ හා පෙළ හා සන්න රහිත විචාර ග්‍රන්ථ වශයෙනුයි. සිදත්සඟරාව උපයුක්ත ව, සිදත්සඟරාව මුල්කරගෙන බිහි ව ඇති විචාර ග්‍රන්ථ විමර්ශනයේ දී සමාජවාග්විද්‍යාවේ භාෂා සැලසුම්කරණ න්‍යාය භාවිත වේ. ඒ සම්මතකරණය, නිර්දේශීකරණය, නවීකරණය හා ඒ ඇසුරින් නව ව්‍යාකරණ ග්‍රන්ථයක් සැකසීමේ අවශ්‍යතාව හඳුනා ගැනීම යි. සිදත්සඟරාවේ සිංහල භාෂාවේ ව්‍යාකරණය දැක්වීම්වල දී විවිධ නොගැළපීම් මෙන් ම අඩුපාඩු හඳුනාගෙන තිබුණ ද දහතුන් වන සියවසේ සිට වර්තමානය දක්වා ම සිදත්සඟරාව මූලික කරගෙන විවිධ විචාර, විස්තර, විමර්ශන ග්‍රන්ථ මෙන් ම ශාස්ත්‍රීය ලිපි ලේඛන බිහිවීමෙන් පෙනී යන්නේ ද එහි ඇති වැදගත්කම යි. එහි ප්‍රතිඵලය වශයෙන් දහතුන් වන සියවසේ සිට වර්තමානය දක්වාම විවිධ සිංහල භාෂා ව්‍යාකරණ ග්‍රන්ථ බිහිව තිබුණ ද සිංහල භාෂාවේ ව්‍යාකරණය ඉගෙන ගැනීමේ අත්පොත මෙන් ම ගුරු පොත බවට සිදත්සඟරාව පත්ව තිබේ.

JOURNAL OF THE FACULTY OF HUMANITIES 32

## 2. සාහිත්‍ය විමර්ශනය

සිදත්සඟරාව පාදක ව භාෂා සැලසුම්කරණය න්‍යායාශ්‍රයෙන් මෙතෙක් අධ්‍යයනයක් සිදුව ඇති බවක් හඳුනාගත නොහැකි ය. පූර්ව අධ්‍යයන කෙරෙහි අවධානය යොමු කිරීමේ භාෂා සැලසුම්කරණ න්‍යාය ආශ්‍රයෙන් නොවුණ ද සිදත්සඟරාව මුල්කරගෙන සිදුව ඇති අධ්‍යයන වන්නේ සන්න, ව්‍යාඛ්‍යාන මෙන් ම විචාර ග්‍රන්ථ බිහිවීම යි. මේ අධ්‍යයනයේ දී හඳුනා ගතහැකි පූර්ව අධ්‍යයන වන්නේ ද මේවා ය ඒ අතුරින් මේ අධ්‍යයනයේ දී අවධානය යොමු වන්නේ සිදත්සඟරාව පාදක ව බිහි ව ඇති විචාර ග්‍රන්ථ පමණි. *සිද්ධාන්ත පරීක්ෂණය හෙවත් ස්වභාෂා නීතිසාරය,* සිදත්සඟරා විනිස, සිදත් සඟරා විවරණය, සිදත් සඟරා අරුත් වියකන, විමර්ශන සහිත සිදත්සඟරාව, සිදත්සඟරා විචාරය සහ සරසවි වියරණය, සිදත්සඟරා පුරාණ සන්නය (සිද්ධාන්ත ප්‍රදීපය), ව්‍යාඛ්‍යාන සහිත සිඳත්සඟරා, සිදත්සඟරා විමසුම ය. මෙහි දී මූලාශ්‍රය කෘතිය වශයෙන් භාවිත වන්නේ බහුතර වියත් මතයෙන් ප්‍රාථමික මූලාශ්‍රය කෘතිය වශයෙන් පිළිගෙන ඇති රත්මලානේ ශ්‍රී ධර්මාරාම හිමියන් විසින් සැකසූ **සිදත්සඟරා විස්තර සන්නය** යි. එය මූලාශ්‍රය කොටගෙන අධ්‍යයනයට විෂය කොටගත් විචාර ග්‍රන්ථවල අන්තර් ගත කරුණු තුලනාත්මක අධ්‍යයනයට ලක්වෙන්නේ සමාජවාග්විද්‍යාවේ භාෂා සැලසුම්කරණ න්‍යාය ඇසුරෙන්ය. එහි දී Language Planning and Social Chang, Language Planning, Language, Language Academics, Language Planning, and the Case of the Hebrew Revival, Language Planning Goals: A Classification Language Problems and Language Planning ග්‍රන්ථ මූලාශ්‍රය වශයෙන් භාවිත වේ. පූර්වෝක්ත ග්‍රන්ථාශ්‍රයෙන් හා සිදත්සඟරාව මෙන් ම සමාජවාග්විද්‍යාව් භාෂා සැලසුම්කරණය ඇතුළත් කෘති, ශාස්ත්‍රීය හා පර්යේෂණ සඟරා ලිපි ආදිය ද පරිශීලනයෙන් දත්ත රැස්කිරීම හා විශ්ලේෂණය සිදුවේ.

## 3. පර්යේෂණ ක්‍රමවේදය

මේ අධ්‍යයනයේ දී භාවිත වූයේ සිදත්සඟරාවේ මුල් පරිච්ඡේද දහයට අයත් ව්‍යාකරණ යි. එහි දී සිදත්සඟරාව විෂය කොටගෙන රචනා වී ඇති විචාර ග්‍රන්ථ මෙන් ම විවිධ ශාස්ත්‍රීය හා පර්යේෂණ ලිපි ලේඛන ද ඇසුරින් දත්ත එක්රැස් කර ගන්නා ලදි. ඉහතින් දැක්වූ විචාර ග්‍රන්ථවලට අමතර ව තත්කාලින සමාජ හා භාෂාවබෝධයට වැදගත් වන හෙයින් ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය[23] සිංහල සාහිත්‍ය වංශය[24] සිංහල භාෂාධ්‍යයන ඉතිහාසය[25] දඹදෙණි යුගය[26] ආදි කෘති ද මේ අධ්‍යයනයේ දී දත්ත එක් රැස්කර ගැනීමට මෙන් ම විශ්ලේෂණයට උදව් විය. භාෂා සැලසුම්කරණයේ දී භාෂාවක අභ්‍යයන්තරයේ සිදු කරන ප්‍රධාන ප්‍රභේද දෙකක් හඳුනාගත හැකි ය. බහුවාර්ගික සමාජයක පවතින භාෂා ගණනාවක් අතුරෙන් රාජ්‍ය භාෂාව බවට කුමන භාෂාව පත් කරන්නේ ද යන්න තීරණය කරන ක්‍රියාවලිය භාෂා තත්ත්ව සැලසුම්කරණයයි (Status Language Planning).

---

[23] රාය, හේම්චන්ද්‍ර. (සංස්.)., (1972). *ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය.* කැලණිය. (විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ සිංහල පරිවර්තනය). විද්‍යාලංකාර විශ්වවිද්‍යාල මුද්‍රණාලය.

[24] සන්නස්ගල, පී., (1961). *සිංහල සාහිත්‍ය වංශය.* (නව සංස්කරණය, 1994). කොළඹ. ලේක්හවුස් මුද්‍රණාලය.

[25] බලගල්ලේ, ඩබ්. ජී., (1998). *සිංහල භාෂාධ්‍යයන ඉතිහාසය.* කොළඹ.එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

[26] සුමනජොති හිමි, ඩී., (2503). *දඹදෙණි යුගය.* II . කාණ්ඩය. වක්කුණුවළ. ශ්‍රී සුගත ග්‍රන්ථාකරය.

කාලීන අවශ්‍යතා උපයුක්ත ව භාෂාවේ අභ්‍යයන්තර ව්‍යූහය සැලසුම්කරණය කිරීම සංහිතා සැලසුම්කරණයයි (Corpus Planning). ඒ අනුව මේ අධ්‍යයනයට පාදක න්‍යායාත්මක පසුබිම සැකසෙන්නේ සංහිතා සැලසුම්කරණයෙන් ය. ඊට පාරිශුද්ධීකරණය, පුනරුත්ථාපනය, සංස්කරණය, සම්මතකරණය, ව්‍යාප්තිකරණය, නවීකරණය, ශබ්දමාලාව සැලසුම්කරණය, ප්‍රයෝගසරලීකරණය[27] වැනි අනුවිෂයයීක සිද්ධාන්ත අයත් ය.

## 4. සාකච්ඡාව හා ප්‍රතිඵල

මේ අධ්‍යයනයේ දී භාෂා සංහිතාකරණය යටතේ සිදත්සඟරාවේ ව්‍යාකරණ රීතිවලට ලැබුණ නිර්දේශීකරණය, සම්මතකරණය හා නවනීතිරීතිවල අවශ්‍යතාව පෙන්වා දෙමින් ඇතැම් රීති  නිර්දේශීකරණය කුමනාකාරයට සිදුකොට ඇත්දැයි යන්න සාකච්ඡාවට ලක්වෙයි. සිදත්සඟරාව වෛෂයිකව විචාර ග්‍රන්ථ ඇසුරින් සිදත්සඟරාවේ ව්‍යාකරණ ප්‍රයෝග පිළිබඳ ව සිදුවන මේ අධ්‍යයනයේ දී මුද්‍රණ ශිල්පීය තාක්ෂණය මෙන් ම සමකාලීන භාෂා ශාස්ත්‍ර පුනර්ජීවන සමයක සමාජ පසුබිම ද හේතු කොටගෙන, බිහි වූ මේ ග්‍රන්ථවල ආරම්භයේ දී සිදත්සඟරාවේ ව්‍යාකරණ විධි පිළිබඳ ව දක්වා ඇති අදහස්වලින් සිදත්සඟරාවට සමාජ ප්‍රභූත්වයක් ගොඩනැගුණ අතර එමඟින් සිදත්සඟරාව සමාජ සම්මතයෙන් සිංහල භාෂාවේ ව්‍යාකරණ රීති ඉගැන්වීමේ නිර්දේශිත කෘතිය බවට පත්වීමට ප්‍රබල හේතුවක් විය. නමුත් විචාර ග්‍රන්ථ කතුවරුන්ගේ මුඛ්‍ය පරමාර්ථය සිදත්සඟරාවේ ඌනතා හෙළිදරව් කිරීම බව පෙනී යයි.  එබැවින් හැඳින්වීමේ දී සිදත්සඟරාවට ලබා දෙන බලයත්, ව්‍යාකරණ විග්‍රහයේ දක්වන ඌනතාත් ප්‍රතිවිරුද්ධ සංකල්ප දෙකක් වූ බැවින් මෙන් ම විචාර ග්‍රන්ථ කතුවරුන්ගේ අදහස් ද සමාන නොවන හෙයින් ද කතුවරුන්ට නොපැහැදිලි වුවත් ඔවුන්ගේ දැක්වීම් ම සිදත්සඟරාවේ සමාජ අධිකාරිත්වය රඳා පැවතීමටත්, සිදත්සඟරාවට ම සමාජ ප්‍රභූත්වයක් හිමිවීමටත් හේතු විය. පහත උපුටා ගැනීම් ඊට නිදසුන් වශයෙන් දැක්විය හැකි ය.

> එහෙත් මේ කාලයෙහි කරන ලද කුඩා මහත් සියලුම ග්‍රන්ථයන් අතුරෙන් ආධුනිකයන්ට අතිශයින් ප්‍රයොජනවත්වූ සකල දිග් ව්‍යාප්ත කීර්තිමාලාවන්ගෙන් යුක්තවූ ග්‍රන්ථය නම් මේ සිදත්සඟරා නම් ස්වභාෂා ව්‍යාකරණ ග්‍රන්ථය වේ.[28]

> කෙසේ වුව ද **සිදත් සඟරාව** සිංහල භාෂාවට අසහාය ව්‍යාකරණ ග්‍රන්ථය වැ සිටී. **අළගියවන්න** මුකවෙටි තුමන් ගේ කාලයෙන් පසු ලක්ෂ්‍යයන් නො විමසා මැ සිදත් සඟරායෙන් ව්‍යාකරණය ඉගැන්වීම සම්ප්‍රදායය වු සේ පෙනේ. 'සමස්ත ලොකයෙහි මෙ තරම් ප්‍රශස්ත ව්‍යාකරණයක් නැත්තේ යැ'යි කියන තරමට ඇතැම් වියතුන් ගේ සිත් මේ ග්‍රන්ථය කෙරෙහි ඇලුණේ යැ[29].

JOURNAL OF THE FACULTY OF HUMANITIES 32

---

[27] Nahir, M., (1984). *Language Planning Goals*. A Classification Language Problems and Language Planning. London. Blackwell
Eastman, C., (1983*). Language Planning*; An Introduction. San Francisc Chandler & Sharp Publishers Inc.

[28] සිප. පිටු/පිටුව (පි). 52-53.

[29] සිසවි. 2508. පි. V - VI.

> මෑතක් වනතුරුම සිංහල භාෂා ව්‍යාකරණය ඉගැන්වීමේ සූත්‍ර ග්‍රන්ථය වශයෙන් භාවිත වූයේ, **සිදත් සඟරාවයි**. දේශීය ව්‍යාකරණ ඇදුරෝද ව්‍යාකරණ ග්‍රන්ථ සැපයීමේ දී සූත්‍ර ශෛලියක් අනුගමනය කළහ. ... සිංහල ව්‍යාකරණය ඉගෙනීමෙහි ලා සිදතින් මෙතෙක් සිදුවුණු සේවය අප සුළු කොට තැකිය යුතු නොවේ. වත්මන් ඇතැම් උගතුන් අන්ත නිර්දය විවේචනයට ලක් කරතත් සිදත ජාතික අවශ්‍යතාවයක් සපුරා ලීමෙහි සමත් විය.[30]

ඇතැම් **සිදත්සඟරා විචාර ග්‍රන්ථ** කතුවරුන්ගේ කෘති පරිශීලනය කළ තවත් විචාර ග්‍රන්ථ කතුවරුන් සිදත්සඟරාවේ ඌනතා පිළිබඳ ව කරන ලද විවේචනයන් බැහැර කිරීමට උත්සුක වූ අතර මේ විචාර ග්‍රන්ථ කතුවරුන්ගේ නිශ්චිත වූ සම්මතයක් නොවීම ද සිදත්සඟරාවේ සමාජ වටිනාකම සම්මත ව පැවැතීමට හේතු විය[31]. විචාර ග්‍රන්ථ කතුවරුන් අතර සිදත්සඟරාවේ ව්‍යාකරණ ප්‍රයෝග පිළිබඳ ව විවිධ මතාකල්ප පැවැතීමත්, සිදත්සඟරාවේ ව්‍යාකරණ රීති දැක්වීම, විග්‍රහය හා නිදර්ශන ඉදිරිපත් කිරීමේ ඌනතා පවතින බව පෙන්වා දෙන විචාර ග්‍රන්ථ කතුවරුන් ම තම ග්‍රන්ථවල හැඳින්වීමේ දී සිදත්සඟරාවේ වටිනාකම හෙළිදරව් කිරීමත් වැනි කරුණු මත සිදත්සඟරාවේ අගය තව දුරටත් වැඩි විය. එය සිදත්සඟරාවේ ව්‍යාකරණ ප්‍රයෝගවල යම් ඌනතා පැවැතුණත් වියතුන් පමණක් නොව පොදු සමාජයෙන් ම සිංහල භාෂාවේ ව්‍යාකරණ රීති ඉගෙන ගැනීමේ කෘතිය ලෙස සිදත් සඟරාව සම්මත වීමට හේතුවක් විය.

**සිදත්සඟරා කර්තෘගේ ව්‍යාකරණ ප්‍රයෝග නිර්දේශීකරණයට ප්‍රබල සම්මතකරණයක් ඇතිවීම එයින් එක් කරුණකි.** පෙළ සන්න සහිත විචාර ග්‍රන්ථ අතුරෙන් ගුණවර්ධනගේ සිද්ධාන්ත පරීක්ෂණය විශේෂ වන්නේ සිදත්සඟරා ව්‍යාකරණ ප්‍රයෝග විචාරාත්මක දෘෂ්ටියකට හසුකොට ඇතැම් රීති සම්මතකරණය, විකල්ප, නව ප්‍රයෝග නිර්දේශීකරණය කරමින් එතෙක් සමාජ සම්මතයේ ව්‍යාකරණ කෘතිය වූ සිදත්සඟරාවේ ව්‍යාකරණ ප්‍රයෝග සඳහා යම් බලපෑමක් ඇති කිරීම නිසා යි. සම්ප්‍රදායට අනුගත නොවී ස්වාධීන චින්තනයකින් සිදත්සඟරා ව්‍යාකරණ ප්‍රයෝග විචාරයට හසු කරන කතුවරයා සිදත්සඟරාවේ අදියර දෙකක් පමණක් (පළමු හා දෙවන) විෂය කොටගෙන ඇති අතර එහි දී සිදත්සඟරා සූත්‍ර පාඨ දක්වමින් ව්‍යාඛ්‍යාන, විස්තර, නීතිසාර ලෙස වර්ග කොට සිදත්සඟරා සූත්‍ර පාඨ අර්ථ යොදාගෙන ව්‍යාකරණ විග්‍රහයේ නියැළුණි. සිද්ධාන්ත පරීක්ෂණය බිහි වීමත් සමඟ සිදත්සඟරාවේ 'සම්මත ව්‍යාකරණ ප්‍රයෝග' වෙනුවෙන් මතවාදාත්මක පසුබිමක් එයින් ගොඩ නැගුණි. එහි එක් ප්‍රතිඵලයක් වූයේ සිදත්සඟරා විනිස යි. ප්‍රඥාසේන සිදත්සඟරා විනිසේ දී සිද්ධාන්ත පරීක්ෂණයෙන් පෙන්වා දුන් සිදත්සඟරාවේ අඩුපාඩු නිෂ්ප්‍රභ කොට ඇති අතර වියත් මතයෙන් ඒ අදහස සම්මකරණයට ද හසු කොට තිබේ.

[30] සිසවිස. පි. 23 23.

[31] සිසවිස. පි. 2-3, ව්‍යාසි. පි. XXXIV – XXXV.

> ‘සිදත්සඟරාවිනිස’ නම්වූ පොතද මෙකල සිදත්සඟරා නම් ස්වභාෂා ව්‍යාකරණය ගැන නඟා තිබෙන දොෂස්ථාන විනිශ්චය කිරීමෙහිලා ප්‍රයෝජනවත් ලෙස ගළපා තිබෙන පොතකැයි මෙයින් ප්‍රකාශ කරම්හ. ‘සිදත්සඟරා විනිස’ නම් මෙම ග්‍රන්ථයෙන් සිදත්සඟරාවට නඟන ලද දෙෂාරෝපන මනාව නිරාකරණය කරන ලද බැව් ශ්‍රී කල්‍යාණි සමාග්‍රී ධර්ම මහා සඞ්ඝ සභාව පිළිබඳ කාරක මහා සඞ්ඝ සභාවේ පිළිගැනීම වේ[32].

විසිවන සියවසේ තෙවන දශකයේ සිට ‘සිදත්සඟරාවේ ව්‍යාකරණ’ පිළිබඳ ප්‍රධාන මත දෙකක් දැරූ දෙපාර්ශ්වයක් සිටි බව හඳුනාගත හැකි ය. ඒ සිදත්සඟරා ව්‍යාකරණ ප්‍රයෝග පිළිගත්, ඇතැම් ව්‍යාකරණවල දුර්වලතා දැක්වූ හා විකල්ප, නව රීති නිර්දේශීකරණය කළ වශයෙනුයි. බහුතර වියත් මතයෙන් ගොඩනැගුණ, සම්මත වූ මෙන් ම දීර්ඝ කාලීන ව සමාජ සම්මතයේ පවතින සම්මතයන්ට ප්‍රතිපක්ෂ මතවාද ගොඩනැගීම හා සමාජ සම්මතකරණයට හසු කිරීම සංකීර්ණ වන්නේ බහුතර මතය ඒ හා බැඳී පවතින හෙයිනි. සිද්ධාන්ත පරීක්ෂණයේ දැක්වීම් සඳහා නිර්දේශිත ගොඩ නැගෙන්නේ කුමාරතුංගගේ සිදත්සඟරා විවරණයෙනි. විසිවන හා විසි එක්වන සියවස්වල වියතුන් සිදත්සඟරාවේ ව්‍යාකරණ ප්‍රයෝගවල ඌනතා දක්වමින් විකල්ප ප්‍රයෝග නිර්දේශ කළ ද ඒ දැක්වීම් මතවාදාත්මක ස්වරූපයෙන් ම පැවතීමට හේතු වී ඇත්තේ ඒ වියතුන් අතර ම පොදු එකඟතාවක් නොමැති වු හෙයිනි.[33] අධිරාජ්‍යවාදී පාලන සමයේ සිංහල භාෂාවේ ආරක්ෂාව, අනන්‍යතාව ගෞරවය වෙනුවෙන් සමාජ මෙහෙවරක් කළ කුමාරතුංගයන්ගේ ව්‍යාකරණ විවරණය (1958), ක්‍රියා විවරණය (2479) සිංහල භාෂාවේ ව්‍යාකරණය දැක්වීමේ සංධිස්ථානයක් වශයෙන් ඇතැම් වියතුන් පෙන්වා දුන්න ද[34] සිදත්සඟරාවට මෙන් සමාජයෙන් ‘ප්‍රභූත්ව සම්මතයක්’ හෝ ‘ආධුනික/වියත් පාඨ්‍ය ග්‍රන්ථයක්’ ලෙස නිර්දේශිතයක් ඒවා වෙනුවෙන් ගොඩ නොනැගුණි. සිදත්සඟරාවේ ව්‍යාකරණ ප්‍රයෝග පොදු සමාජයේ දීර්ඝ කාලයක් සම්මතව පැවතීම, සිදත්සඟරා විවරණයේ දී ආවේග ශීලිත්වයෙන් හා දැඩි ව සිදත්සඟරා ව්‍යාකරණ ප්‍රයෝග විවේචනයට හසු කිරීම වැනි කරුණු ද ඒ සඳහා බලපෑවා විය හැකි ය.

කුමාරතුංගයන්ගේ මේ විවේචනාත්මක ස්වරූපය තෙන්නකෝන් තව දුරටත් ප්‍රබල කළේ ය (සිඅවි, 1967). සිදත්සඟරා විමසුම (1965), සිදත්සඟරා විචාරය හා සරසවි විවරණය (1966), සිදත්සඟරා විමසුම (2004) යන ග්‍රන්ථවලින් සිද්ධාන්ත පරීක්ෂණයෙන් නිරූපණය කළ විවේචනාත්මක ස්වරූපය සම්මතකරණය කළ ද ව්‍යාඛ්‍යාන සහිත සිදත්සඟරාවෙන් (1998) සිදත්සඟරාවේ ව්‍යාකරණ දැක්වීම්වලට සාධාරණීකරණයක් ඉටු කිරීමට උත්සාහ ගනිමින් වැඩි වශයෙන් සිදත්සඟරා ව්‍යාකරණ ප්‍රයෝග සම්මතකරණය කොට ඇත (ව්‍යාසි, 1998). සිද්ධාන්ත පරීක්ෂණයෙන් පසු සිදත්සඟරාව විෂයෙහි සැපයුණු සන්න හා විචාර ග්‍රන්ථ විමර්ශනයෙන් ඉස්මතු වී පෙනෙන්නේ සිදත්සඟරාවේ ව්‍යාකරණ රීති ප්‍රස්තුත ව මතවාදාත්මක ස්වරූපයක් පවතින බවකි.

JOURNAL OF THE FACULTY OF HUMANITIES-32

[32] ප්‍රඥාසේන, ඊ. ඩී. සී., (1924). *සිදත් සඟරා විනිස නොහොත් සිද්ධාන්ත පරීක්‍ෂණයට පිළිතුරු.* ඊ. ඩී. රොබර්ට් අප්පුහාමි. විද්‍යාර්ථ ප්‍රකාශ යන්ත්‍රාලය.

[33] විසි. ව්‍යාසි. සිවි.

[34] සිවි. ප්‍රස්තාවනාව. ප්‍රේමරත්න. ඒ. සී., (2001). *‘නව සියවසට නව වියරණයක්’* සාරස - ශාස්ත්‍රීය සංග්‍රහය. කොළඹ. එස්. ගොඩගේ සහ සහෝදරයෝ. පි. 17. බලගල්ලේ. ඩබ්. ජී. (1998). *සිංහල භාෂාධ්‍යයන ඉතිහාසය.* කොළඹ, එස්. .

**එබැවින් විසිවන හා විසි එක්වන සියවස් සිදත්සඟරා ව්‍යාකරණ රීති පිළිබඳ ව 'මතවාදාත්මක යුගයක්'** ලෙස ද නම් කළ හැකි ය. මෙවැනි පරිසර නිර්මාණය වීම භාෂා සැලසුම්කරණයට අනුව නව රීති සැකසීමටත්. නව ව්‍යාකරණ ග්‍රන්ථ සම්පාදනය වීමටත් හේතු වෙයි.

ව්‍යාකරණ රීති වර්තමානයට ප්‍රාමාණික නොවුණ ද සිදත්සඟරා ව්‍යාකරණ රීති සමාජ සම්මතයේ දීර්ඝ කාලයක් පැවතීම, නව රීති සම්මතකරණය වීමට කාලයක් ගතවීම, විචාර ග්‍රන්ථවල වියත් මතවාද ඇසුරෙන් ව්‍යාකරණ රීතිවල එක් ස්වරූපයක් සම්මත නොවීම, මතවාද පරස්පර වීම ආදි කරුණු මුල් කරගෙන සිදත්සඟරාව සඳහා ගොඩනැඟී තිබූ සම්මතය දීර්ඝකාලීන ව ආරක්ෂා වීමට හේතු වී ඇතැයි ද සැලකිය හැකි ය. එමෙන් ම විචාර ග්‍රන්ථවල නොවූ මේ ඒකමතික නිර්දේශය සමාජවාග්වේදීන් 'අවිධිමත් සම්මුති ආකෘතිය' ලෙස හඳුන්වා ඇත.[35] එහි එක් ප්‍රතිඵලයක් ලෙස පෙන්වා දිය හැකි වන්නේ වර්තමානයේ දී ත් ව්‍යාකරණ රීති ඉගෙන ගැනීමට හා ඉගැන්වීමට සිදත්සඟරාව ම භාවිත කිරීම යි. ඒ අතර ඇතැම් සිදත්සඟරා ව්‍යාකරණ රීති සම්මතකරණය, විකල්ප ප්‍රයෝග ඇසුරෙන් නව රීතී දැක්වීම, ඒ මඟින් සිංහල භාෂාවේ ව්‍යාකරණ පද්ධතිය නවීකණයට හසු කිරීම වැනි භාෂා සැලසුම් ප්‍රයත්න විචාර ග්‍රන්ථ ඇසුරෙන් ක්‍රියාත්මක වූ බව ද සඳහන් කළ හැකි ය[36].

සිදත්සඟරා අක්ෂර මාලාව (බිංදුව හා දීර්ඝාක්ෂර සහිත) සියලු විචාර ග්‍රන්ථවලින් සම්මතකරණයට හසු වූ අතර පසුකාලීන ව බිහි වූ සියලු අක්ෂර මාලාවන්ට බිංදුව හා දීර්ඝාක්ෂර ඇතුළු වී තිබේ. ඒ අතර වදන් කවි පොත (ක්‍රි. ව. 18 සියවස), රාජකීය ආසියාතික සමිතිය මඟින් ප්‍රාරබ්ධ වූ 'සිංහල-ශබ්දකෝෂයේ' මුලින් දැක්වෙන්නේ අක්ෂර පටිපාටිය (1937), සිංහල විශ්වකෝෂයේ පළමු වන කාණ්ඩයේ දැක්වෙන අක්ෂර පරිපාටිය (1963), හරිස්චන්ද්‍ර විජේතුංගයන්ගේ ප්‍රායෝගික සිංහල - සිංහල ශබ්ද කෝෂයේ අනුපිළිවෙළ (1982), ජාතික අධ්‍යාපන ආයතනයේ සිංහල ලේඛන රීතියේ අක්ෂර මාලාව (1989) ජේ. බී. දිසානායකයන්ගේ සිංහල හෝඩියේ 'ජාත්‍යන්තර සිංහල හෝඩිය' (2000) (නූතන සිංහල ලේඛන ව්‍යාකරණය 1990 හැර) (Standard Unicode 3.0: 2000) සිංහල කේතාවලියට අයත් අක්ෂර මාලාවේ ස්වරවලට පසුව ව්‍යංජනාක්ෂරවලට පෙරටුව බිංදුව ඇතුළු කොට තිබුණ ද සිදත්සඟරා විචාර ග්‍රන්ථවල සිදත්සඟරා කතුවරයාගේ නිර්දේශිතය අනුගමනය කොට ව්‍යංජනාක්ෂරවලින් පසුව බිංදු ශබ්දය දක්වා ඇත. සිදත්සඟරා කතුවරයාගේ 'අං' බිංදු වර්ණය රූපණය කිරීමේ ස්වරූපය ද අක්ෂර මාලා කිහිපයක හැර[37] එතෙක් පැවැති සම්ප්‍රදායෙන් බැහැර ව විවිධ සාධක ආශ්‍රයෙන් බිංදුව හා දීර්ඝාක්ෂර අක්ෂර මාලා ගත කළ ඒ නිර්දේශිතය සිදත්සඟරාව මූලාශ්‍රය කොටගෙන බිහිව ඇති සියලු ග්‍රන්ථවලින් සම්මතකරණය වූ අතර එය පොදු සමාජ සම්මතයට ලක් ව ඇත.

[35]Schiffman. H. F., (1998). (27). '*Standardization or restandardization. The case for 'Standard' Spoken Tamil. Language in Society.* Page/ Pages (P). 36.

[36] දිවාකර, අනුරින්, ඉන්දිකා., (2017). *සිදත්සඟරාවේ භාෂා සැලසුම්කරණ. සිදත්සඟරාව. පසුකාලීන භාෂා සැලසුම්කරණ.* කොළඹ. සමයවර්ධන ප්‍රකාශකයෝ.

[37]බලගල්ලේ, ඩබ්. ජී., (2004). *කුමාරතුංග මුණිදාස ශාබ්දිකයකු ලෙස.* විසිදුනු විමැසුම - 1. සුවහස් නය මනැසි ඉසිවරයාණෝ. බොරලැස්ගමුව. විසිදුනු ප්‍රකාශකයෝ. පි. 58-66.

JOURNAL OF THE FACULTY OF HUMANITIES

සිදත්සඟරාව සම්පාදිත අවධිය අධ්‍යයනයේ දී අක්ෂර මාලාව පිළිබඳ ගොඩනැඟී ඇත්තේ ගැටලු සහගත බවකි.[38] සිදත්සඟරා කතුවරයා හඳුනාගෙන සිටි එහෙත් යම් යම් ගැටලු මත අක්ෂර මාලා ගත කළ නොහැකි වූ ශබ්ද හයක් වෙනත් විධි ක්‍රමවලින් දැක්විය (මත්වැඩි, ඇ, ඈ) (මත් අඩු, ඟ, ඬ, ඳ, ඹ)[39]. විචාර ග්‍රන්ථ කතුවරුන් ඒ භාවිතයන් පාදක කොටගෙන සිදත්සඟරා අක්ෂර මාලාව සංවර්ධනය කර ඇත්තේ, සිදත්සඟරා අක්ෂර මාලාව අක්ෂර 33 කින් (ඇ ඈ සහ නව ෆ සහිතව)[40] තිස් දෙකකින් (ඇ, ඈ)[41] තිස් හයකින් (ඇ, ඈ, ඟ, ඬ, ඳ, ඹ)[42] සමන්විත වන බව නිර්දේශ කරමින් ය. වර්තමානයේ දී සිංහල අක්ෂර මාලාවට ශබ්ද 30ක සිදත්සඟරා අක්ෂර මෙන් ම පතිරජ පිරිවන්පති හිමියන් වෙනත් විධි ක්‍රමවලින් දැක්වූ (ඇ, ඈ, ඟ, ඬ, ඳ, ඹ) ශබ්ද හය ද ඇතුළු ව තිබීම අක්ෂර මාලාව නවීකරණය විෂයයේ වැදගත් කරුණකි. පුරාණයේ පැවැති යැයි සැලකිය හැකි අක්ෂර මාලාව සිදත්සඟරා කතුවරයා කාලීන අවශ්‍යතා වෙනුවෙන් නවීකරණයට හසු කළ අතර සිදත්සඟරා විචාරකයෝ සිදත්සඟරාව වෛෂයික ව අක්ෂර මාලාව සංස්කරණය කළහ.

සිදත්සඟරාවේ සන්ධි රීතිය පිළිබඳ ව අවධානය යොමුකොට ඇති විචාර කතුවරුන් පරරූප සන්ධිය නොදැක්වීමට හේතු දක්වීමට කතුවරයා උත්සුක වූයේ නම් ස්වර පූර්ව රූපයට නිදර්ශන සැපයූයේ නම් සන්ධි විග්‍රහය සම්පූර්ණ වන බව පෙන්වා දීමෙන් ද[43] පරරූප සන්ධිය නොදක්වා ඇත්තේ පැරණි ගී කාව්‍ය කෘතිවලින් එය සනාථ කිරීමට සාධක සොයාගත නොහැකි බැවිනැයි දැක්වීමෙන් ද[44] තහවුරු වන්නේ සිදත් සඟරා කර්තෘගේ නිර්දේශිතයන් පිළිගත් බවකි.

සිදත්සඟරාවේ පද දෙකක් අතර සිදුවන සන්ධියට නිදසුන් සැපැයුණ ද තනි පදයක ශබ්ද දෙකක් අතර සිදුවන සන්ධිය නොදැක්වීම සිදත්සඟරා සන්ධි විග්‍රහයේ ඌනතාවක් ලෙස පෙන්වා දෙන සිදත්සඟරා විචාරකයන් බාහිර හා අභ්‍යන්තර වශයෙන් සිංහල භාෂාවේ සන්ධි වර්ගීකරණය කොට තිබේ.[45] ඒ අතර සන්ධි බාහිර හා අභ්‍යන්තර ලෙස වෙන්කොට ගැනීම දුෂ්කර බව ද තවත් විචාරක මතයකි.[46] එසේ වුව ද විචාරක, වියත් පොදු මතයෙන් සිදත්සඟරා සන්ධි විභාගය සංස්කරණයෙන් සංවර්ධනයට හසු ව ඇතැයි සඳහන් කළ හැකි වන්නේ වර්තමාන උසස් අධ්‍යාපනයේ දී සන්ධි අධ්‍යයනයේ දී බාහිර හා අභ්‍යන්තර (නිත්‍ය හා අනිත්‍ය) වර්ගීකරණය යටතේ සන්ධි ප්‍රයෝග විද්‍යාර්ථීන් විසින් අධ්‍යයනය කරනු ලබන හෙයිනි.

එසේ වුව ද සිදත්සඟරා කතුවරයා විසින් අභ්‍යන්තර සන්ධියක් නොදැක්වීමට හේතු විමසුව හොත් පෙනී යන්නේ පදයක සිදුවන සන්ධිය භාෂා භාවිතයන් ස්වාභාවිකව ම ඉගෙන ගන්නා බව යි.

---

[38] ඒකනායක. පි., (1996). *'සිංහලයේ දේශීය අනන්‍යතාව ප්‍රකට කරන වර්ණමාලාව'* සම්භාෂා. 7 කලාපය.බත්තරමුල්ල. පිරිවෙන් ශාඛාව. 137.

[39] සිවිස. පි. 30-31.

[40] සිප. පි. 76.

[41] සිවි. පි. 52. ව්‍යාසි. පි. 49.

[42]සිවි. පි. 39.

[43] විසි. පි. 49-55.

[44] ව්‍යාසි. පි. XXV.

[45] සිප. පි. 213. සිසවිස. පි. 109. ව්‍යාසි. පි. 114. සිවි. පි. 58 - 60.

[46] විසි. පි. 152.

JOURNAL OF THE FACULTY OF HUMANITIES 32

ඒ සන්ධි කිරීමක් හෝ වීමක් සන්ධි කොට දැක්වීම අනවශ්‍ය කාරණයක් වන බැවිනි. එමෙන් ම ස්වර සන්ධියේ ප්‍රභේද හතක් හා එහි අනු ප්‍රභේද දාසයක් නිර්දේශීකරණය,[47] සන්ධි එකොළහක් ඇතැයි නිර්දේශීකරණය[48] ව්‍යාකරණ ප්‍රයෝග සංවර්ධනය පක්ෂයෙහිලා සිදත්සඟරා විචාරකයන්ගේ භාෂා සැලසුම් ප්‍රයත්න වශයෙන් සැලැකිය හැකි වුව ද සිදත්සඟරා මතය (සන්ධි නවය) තවමත් සම්මතකරණයේ ද වෙයි. එසේ වුව ද බාහිර හා අභ්‍යන්තර සන්ධි විධිය නොදැක්වීම භාෂා සැලසුම්කරණය විෂයට අනුගතව සිදත්සඟරා කතුවරයාගේ ඌනතා වශයෙන් ද කෙනෙකුට කරුණු දැක්විය හැකි ය.

කාව්‍ය භාෂාව වීමසීමේ දී සිදත්සඟරාවේ ලිංග විභාගය විශේෂ වන අතර එය සිදත්සඟරා කතුවරයාගේ ස්වාධීනතාවක් සේ ද පිළිගැනෙයි.[49] සන්න සේ ම විචාර ග්‍රන්ථ කතුවරුන් සිදත්සඟරා කතුවරයා ලිංග දෙකක් දැක්වීමට හේතු පෙන්වා දීමෙන් ද[50] අවබෝධ වන්නේ සිදත්සඟරා කර්තෘගේ නිර්දේශිතය ඍජු ව ම ප්‍රතික්ෂේප නො කළ බවකි.

සිදත්සඟරාවේ ලිංග දෙකක් ඉදිරිපත් කිරීම සිංහල භාෂා ව්‍යවහාරයේ ලිංග විග්‍රහයට ප්‍රාමාණික නොවන බවත්, නපුංසක ලිංගය එක්වීමෙන් එය සම්පූර්ණ වන බවත් සිදත්සඟරා විචාරක මතය වුව ද[51] අමිශ්‍ර සිංහල භාෂාව (කාව්‍ය භාෂාව) උපයුක්ත ව ලිංග දෙකක් දැක්වීම දහතුන් වන සියවසට ප්‍රාමාණික බව ද වියත් ආකල්පයකි.[52] සිංහල භාෂාවේ ව්‍යාකරණ ප්‍රයෝගවල ව්‍යූහ සැලැස්ම හා සැලැකීමේ දී නපුංසක ලිංගය නිර්දේශිතය. සිදත්සඟරා විචාරකයන්ගෙන් සිදු වූ භාෂා සැලසුම් ක්‍රියාවලියක පියවරක් ලෙස හඳුන්වා දිය හැකි වෙයි. අර්ථ ක්‍රියාවල කර්තෘ කාරක වර්තමාන කෘදන්ත සඳහා නිදසුන් සපයා තිබුණ ද කර්තෘ කාරක, කර්ම කාරක අතීත, වර්තමාන නිදසුන් සපයා ගැනීමට සිදුවන බව නූතන වියතුන් පෙන්වා දීමෙන්[53] පෙනී යන්නේ සිදත්සඟරා කතුවරයාගේ ලිංග විග්‍රහයට පොදු වියත් මතයෙන් සම්මතයක් ගොඩ නැඟී තිබුණ බවකි. ස්ත්‍රී ලිංග නාම සාධකයේ දී වුව ද සිදත්සඟරා කතුවරයා ප්‍රත්‍ය කිහිපයක් දක්වා තිබුණ ද 'ඇ' මඟින් තවත් ප්‍රත්‍ය ඇතැයි පෙන්වා දී ඇත. එමෙන් ම ප්‍රත්‍ය සම්පාදනය ඡේක ව්‍යවහාරයට අනුගත විය යුතු යැයි දැක්වීමෙන් ද[54] පෙනී යන්නේ සිදත්සඟරා 'ලිංග විග්‍රහය' සම්මත කරමින් නවීකරණය විය යුතු බවක් ද පෙන්වා දීමකි.

සිදත්සඟරා කර්තෘ සිංහල භාෂාවේ විභක්ති නවයක් නිර්දේශීකරණය කළ ද සිංහල භාෂාවේ විභක්ති පහක් පැවැති බවත්, ඒ පිළිබඳ ව සිදත්සඟරා කතුවරයා දැන සිටි බවත්, එ නිසා ම විභක්ති විග්‍රහය ආශ්‍රයෙන් ම එය පෙන්වා දුන් බවත් තවත් විචාර පිළිගැනීමකි[55].

JOURNAL OF THE FACULTY OF HUMANITIES-32

[47] සිප. පි. 213-248.

[48] සිසවිස. පි. 317- 318.

[49] ව්‍යාසි. පි. XXV, 155.

[50] සිවිස. රතනසාර හිමි, කහවේ ශ්‍රී සුමංගල., (1929). (සංස්කරණය). *විස්තර ගැටපද විවරණ සහිත සිදත්සඟරා භාවසන්නය*. කොළඹ. මහාබෝධි යන්ත්‍රාලය. (සිහාස). සිපුස. පි. 68-69.

[51] සිසවි. පි. 186. සිසවිස. පි 35-55. විසි. පි. 166. සිඅවි. පි. 143 - 171. සිවි. පි. 73.

[52] ව්‍යාසි. පි. XXV-XXVI.

[53] සිසවි. පි, 186.

[54]

[55] සිසවිස. පි.56 -74.

ජේක ප්‍රයෝග භාවිතයට ගෙන ඒ ඇසුරෙන් විභක්තිවල අර්ථ ප්‍රධාන කොට ව්‍යවහාරයේ වූ රූප ද හඳුන්වා දෙමින් විභක්ති නිර්දේශකරණයට එළැඹ ඇති බවත්[56], සිදත්සඟරා කතුවරයාගේ මේ විභක්ති විග්‍රහය සී. ජේ. ෆිල්මෝ (C. J. Fillmore) නම් වාග්වේදියාගේ විභක්ති විග්‍රහයට සමාන බවත්, සංස්කෘත භාෂාවේ වුව ද නොපෙනෙන විධිමත් මෙන් ම කතුවරයාගේ ස්වාධීනතාව හෙළිදරව් වන විග්‍රහයක් සිදත්සඟරාවෙන් ඉදිරිපත් වන බවත් විසිවන සියවසේ විචාර ග්‍රන්ථ කතුවරුන්ගේ පිළිගැනීම විය.[57]

කුමාරතුංග විද්‍යාර්ථීන් නොමඟ යවනසුලු ප්‍රකාශ කිහිපයක් ම දක්වා අතැයි සමාස ප්‍රයෝගයේ නිදසුන් ආශ්‍රයෙන් ඉදිරිපත් කරන ජයතිලක දහතුන්වන සියවසේ දැක්වීම් සම්මතකරණය කොට ඇත්තේ විසිවන සියවසේ දැක්වීම බැහැර කරමිනි.[58] සිංහල පද්‍ය භාෂාව විමසා නිදසුන් ඇසුරෙන් සිංහල භාෂාවට ගැළපෙන ආකාරයට සමාස, වර්ග පහකට බෙදා ඇති බව තවත් පිළිගැනීමකි.[59] එය සිංහල භාෂාවට අනවශ්‍ය ව්‍යාකරණ ප්‍රයෝගයක් බවත්, අව්‍ය, විශේෂණ හා අන්‍යාර්ථ සිංහල භාෂාවේ ක්‍රියාත්මක වන බවක් නොපෙනෙන නමුත් සිදත්සඟරා කර්තෘගේ ස්වාධීනත්වය නිරූපණය වන ව්‍යාකරණ ප්‍රයෝගයක් බවත් පිළිගැනෙයි.[60] සන්ධි ක්‍රියාවලිය වර්ණ මතත්, සමාස ක්‍රියාවලිය පද මතත් සිදුවන්නක් බැවින් ව්‍යාකරණයේ දී භාෂා ව්‍යවහාරයට අවශ්‍ය අංගයක් බවට ද අදහසකි.[61] සිදත්සඟරාවේ සමාස පිළිබඳ විවිධ මාතාකල්ප වුවත් එහි පවතින විවිධත්ව නිසා 'බලයක් ලැබී ඇත්තේ' සම්මත වී ඇත්තේ සිදත්සඟරා කර්තෘ විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශිතයන්ට ය.

සිදත්සඟරා කතුවරයාගේ ක්‍රියා විග්‍රහයේ 'අනාගත කාලය' පිළිබඳ ව නූතන විචාර ග්‍රන්ථ කතුවරුන් අතර විවිධාකාර වූ ආකල්ප පැවැතිය ද අනාගත කාලය දැක්වීම 'දූරදර්ශී ක්‍රියාවක්' බව ද පිළිගැනෙයි.[62] සිංහල භාෂාවේ ඇති ආඛ්‍යාත නාම නොහොත් කෘදන්ත, නිපාත ආදිය පිළිබඳ ව ක්‍රියාධිකාරයේ දී දක්වා ඇති බව පෙන්වා දීමෙනුත්, අසම්භාව්‍ය ක්‍රියාව කාලත්‍රයේ යෙදීමේ දී වචන භේදයක් නොමැති බව දැක්වූයේ නම් සිදත්සඟරා කතුවරයාගේ විග්‍රහය වඩාත් නිවැරැදි යන ආකල්පවලිනුත්, පූර්ව ක්‍රියාව එක ළඟ දෙවතාවක් භාවිත කිරීමෙන් මිශ්‍ර ක්‍රියාව සෑදෙන බව පෙන්වා දීම, සිංහල භාෂාවට ආවේණික රීතියකැයි හෙළිදරව් කිරීමෙනුත්[63] ක්‍රියාව හඳුන්වා දී ඇති අයුරු 'සාර්ථක යැයි' යන සඳහන්වලිනුත් සිදත්සඟරා කතුවරයාගේ දැක්වීම්වලට ගොඩනැගෙනුයේ ප්‍රබල සම්මතයක් වන අතර සිංහල භාෂාවේ ව්‍යාකරණ ප්‍රයෝග පිළිබඳ ව සිදත්සඟරා කතුවරයා තුළ වූ ප්‍රාමාණික දැනුම ද එයින් විශද වෙයි.

JOURNAL OF THE FACULTY OF HUMANITIES 32

---

[56] සිභාස. පි. 101, 173.
[57] ව්‍යාසි. පි. 166-167.
[58] විසි. පි. 223- 226, 229.
[59] ව්‍යාසි. පි. 237.
[60] සිවි. පි. 119, 137.
[61] සිදත්සඟරා විමසුම. පි. 107.
[62] විසි. පි. 240.
[63] සිවි. පි. 148, 183, 189.

සිදත්සඟරාවේ ක්‍රියාකාරක පද සම්බන්ධය[64] ෆිල්මෝ (Fillmore) නම් වාග්විද්‍යාඥයා දැක්වූ Case Grammar නම් වාග්විද්‍යාත්මක සංකල්පයට සමීප බවත් එනිසා ම අල්විස් පඬිතුමන්ගේ The Sidath Sangarawa - A Grammar of the Sinhalese Language (1851) කෘතිය ඇසුරු කොට මේ වාග්විද්‍යාඥයා තම වාග්විද්‍යාත්මක සංකල්පය ගොඩනැගුවේ යැයි යන සැකය මතුවන බවත්, එසේ වුවහොත් මේ සිද්ධාන්තයේ ආදී කර්තෘත්වය හිමිවන්නේ සිදත්සඟරා කතුවරයාට බවත් පෙන්වා දෙන්නේ මහාචාර්ය අබේසිංහ ය.[65] එසේ ම අර්ථ සම්පන්න වාක්‍ය සම්පාදනයේ දී ක්‍රියාකාරක පද සම්බන්ධය වැදගත් බව විසිවන හා විසි එක්වන සියවසේ වියතුන්ගේ ද නිර්දේශිතය වෙයි.[66]

ක්‍රියා කාරක පද සම්බන්ධයේ දී කතුවරයා පූර්ව ක්‍රියාව හා අවසාන ක්‍රියාව අතර වන සම්බන්ධය පිළිබඳ පමණක් දැක්වූව ද මිශ්‍ර, අසම්භාව්‍ය, ප්‍රයෝජ්‍ය, ආශීර්වාද හා කාරක අතර පවතින සම්බන්ධය පෙන්වා දීමත්, සිදත්සඟරා කතුවරයා කාරකවලින් ක්‍රියා නිෂ්පත්තිය සිදුවන අයුරු දැක්වීමට සීමා වුවත් ක්‍රියාවලින් ද කාරක නිෂ්පත්තිය සිදුවන ආකාරය පෙන්වා දීමත්[67] සිදත්සඟරා විචාරකයන්ගෙන් සිදත්සඟරාවේ ව්‍යාකරණ ප්‍රයෝගවල ඌනතා මඟහරවා ව්‍යාකරණ ප්‍රයෝග සංවර්ධනය සඳහා දැරූ ප්‍රයත්නය යි.

වෙසෙසුන් වෙසෙස් අදියරයේ දී ව්‍යාකරණය, අක්ෂර, නිරුක්ති, පද හා වාක්‍ය විභාගය යන කොටස් හතරට අනුකූල ව සිදත්සඟරා කතුවරයා විග්‍රහයට පෙළඹුණි නම් වැදගත් බව පෙන්වා දීම,[68] ක්‍රියාධිකාරයේ අනාගත කාල ආඛ්‍යාත ක්‍රියාව නම් වර්තමාන කෘදන්ත ක්‍රියාව බව පෙන්වා දීම[69] සිදත්සඟරාව මූලාශ්‍රය වී ඉදිරිපත් වූ නව මානයන් ය. ක්‍රියා විභාගයේ දී ක්‍රියා ප්‍රකෘති ගණවලට වෙන්කොට අවසාන හා අනවසාන වශයෙන් ගෙන වාක්‍ය විභාග ආශ්‍රයෙන් විමසීම, වාක්‍ය විභාගය සරල හා සංකීර්ණ ලෙස වර්ග කොට විග්‍රහයට ලක්කිරීම වඩාත් උචිත බව පෙන්වා දීම[70] සිදත්සඟරාව මූලාශ්‍රය වී ගොඩනැගුණ භාෂාවක ව්‍යාකරණ සංස්ථිතියේ විග්‍රහාත්මක ක්‍රමවේද ලෙස නාමීකරණය කළ හැකි ය.

කෘදන්ත පදවල වරනැගීම් ස්වරූපය නාම පදයක්, වාක්‍යාවසාන ක්‍රියාවක්, නාම විශේෂණයක් ලෙස පෙන්වා දීම ද[71] තවත් එවැනිම අවස්ථාවකි.

මේ අනුව සන්න (සිදත්සඟරා සන්නය, පුරාණ සන්නය, ලියන සන්නය) කෘතිවලින් සිදත්සඟරාවේ ව්‍යාකරණ රීති පැහැදිලි කරමින් සම්මත කරණය කළ ද සිදත්සඟරාව මූලාශ්‍රය කොටගෙන බිහි වූ විචාර ග්‍රන්ථවලින් වැඩි වශයෙන් ම සිදත්සඟරාවේ ව්‍යාකරණ ප්‍රයෝගවල දුර්වලතා අනාවරණය විය. මේ විචාර ග්‍රන්ථවල සිදත්සඟරා ඌනතා දැක්වීමට වැඩි වශයෙන් අවධානය යොමු කොට ඇති බැවින් ඒ කෘති සිදත්සඟරාවේ ඇතැම් ව්‍යාකරණ රීති සම්මතකරණය කළ ද එය කැපී නොපෙනේ.

---

64 සිවිස. පි. 183-184.
65 ව්‍යාසි. පි. 303.
66 ව්‍යාසි. පි. 303. සිවි. පි. 221.
67 සිවි. පි. 215, 220.
68 සිදත්සඟරා විමසුම.
69 සිසවිස. පි. 18. සිවි. 151.
70 ව්‍යාසි. පි. 283.
71 විසි. පි. 197.

JOURNAL OF THE FACULTY OF HUMANITIES-32

ඇතැම් ව්‍යාකරණ ප්‍රයෝග සම්මත වීමටත්, සිදත්සඟරාවේ ව්‍යාකරණ රීති ආරක්ෂා වීමටත් මේ විචාර ග්‍රන්ථ ද හේතු විය. සිදත්සඟරාවේ ව්‍යාකරණ රීති පිළිබඳ විචාර ග්‍රන්ථ කතුවරුන් අතර ඒකමතික ව සම්මතයක් නොවීම ද, විවිධ මතාකල්ප දැක්වීම ද ඔවුන්ගේ විචාර ග්‍රන්ථවල ප්‍රයෝග සම්මතකරණයට හසු නොවීමට බලපා ඇති බවක් හඳුනාගත හැකි ය.

සිදත්සඟරා විචාර ග්‍රන්ථවලින් බොහෝ විට ඉදිරිපත් ව ඇත්තේ සිදත්සඟරා ව්‍යාකරණ ප්‍රයෝග සඳහා 'සිද්ධාන්ත සංස්කරණයක්' දැක්වීමකි. සිදත්සඟරා කර්තෘ පෙරළි විග්‍රහයේ දී ස්වරාදේශ සඳහා ඉදිරිපත් කොට ඇති 'පිළි පෙරළි', 'සර පෙරළි' ලෙස නිර්දේශිතය ද මීට නිදසුන් ය.[72]

පූර්ව ස්වර ලෝප සන්ධියේ දී (පෙරසරලොප්සඳ) 'පූර්ව ස්වරය ලොප් වීමෙන් අපර ස්වරය ගාත්‍රාක්ෂරය හා ගැළපුණේ යයි කියන ලද්දේ නම් ශාස්ත්‍රීය යැ'.[73] සරසඳ - ස්වර සන්ධිය  ස්වරා රොහණ[74] ආරෝහණ[75] ව්‍යඤ්ජන ස්වර සන්ධිය නොහොත් ස්වරාරූඪ සන්ධිය[76] සරරුහ සඳ[77] සරදෙස් සඳ - ස්වරාදේශ සන්ධිය, සර දෙස් ව්‍යවහාරයට වඩා සිදත්සඟරා  කතුවරයාගේ ලිංග නාමිකරණය 'මොහු යැ මැය යැ මෙය යැ යන වහරට කරුණු වූයේ ලිඟු නම්' දැක්වීම වඩාත් යෝග්‍ය බව පෙන්වා දෙයි.[78] ඒ අතර සිදත්සඟරා කර්තෘගේ ලිංග විග්‍රහය ශාස්ත්‍රීය වූවක් බවත් ඇතැම් විචාර මතාකල්පයකි.[79] සිදත්සඟරාවේ විභක්ති විග්‍රහය 'නමින් හා දයින් පරව යෙදී නම හා දය බෙදනුයේ විබත් නම්' වශයෙන් නිරූපණය කළේ නම් නිවැරැදි වීමට ඉඩ තිබූ බව ද පෙන්වා දී තිබේ.[80] සමාස විග්‍රහය පාලි විග්‍රහයට අනුගත වූයේ නම් යෝග්‍ය බව 'සමාසො පදසංඛෙපො'[81] පෙන්වා දෙන අතර සිදත්සඟරා විග්‍රහ වාක්‍ය සම්පූර්ණ වීමට නම් යුක්තාර්ථවත් භාවය හා සමාස වන පද ශබ්ද නමින් හැඳින්වීම යන ඌනතා දෙක සැපිරීම අවශ්‍ය බව ද දැක්වෙයි.[82] අසම්භාව්‍ය ක්‍රියාව වරනැඟීම් ස්වරූපයෙන් මෙන් ම වචන භේදයක් ද නොමැති හෙයින් 'ආවස්ථික නිපාත' නාමය උචිත ය.[83] සිදත්සඟරා කර්තෘගේ විග්‍රහාත්මක නිර්දේශිතයන්ට 'විකල්ප විග්‍රහාත්මක ප්‍රයෝග' ඉදිරිපත් වීම විචාර ග්‍රන්ථවල පොදු ලක්ෂණයකි. ජීවමාන භාෂාවක කාලීන පරිණාමයන් ද ඇතුව සංවර්ධනය වීම ස්වාභාවික වූවකි. සිදත්සඟරා කතුවරයා දහතුන්වන සියවසේ දී ඒ වන විට සැකැසී තිබූ අමිශ්‍ර සිංහල ග්‍රන්ථ ආභාසයෙන් ප්‍රකට කළ මේ සිද්ධාන්ත විග්‍රහය විවිධ වූ සමාජ, සංස්කෘතික,

[72] සිප. පි. 138. සිවි. පි. 101. සිවි. පි. 41.
[73] සිප. පි. 200.
[74] විසි. පි. 155.
[75] සිවි. පි. 169.
[76] සිප. පි. 202
[77] ව්‍යාසි. පි. 118.
[78] සිවි. පි. 66.
[79] සිප. පි. 86.
[80] සිවි. පි. 89.
[81] විසි. පි. 215. අබේකෝන්, ඒ. එම්. ලොකුබණ්ඩාර. (2001). *සිංහල ව්‍යාකරණ සමීක්ෂා.* (සිදත්සඟරාවආශ්‍රිතව). මහනුවර. ග්‍රැපික් ලැන්ඩ්. පි. 68.
[82] සිවි. පි. 115.
[83] සිවි. පි. 186.

JOURNAL OF THE FACULTY OF HUMANITIES-32

දේශපාලන පරිවර්තන සිදුවීම් සමූහයකින් පසුව විසිවන හා විසි එක්වන සියවසේ වියත් දැනුම් ප්‍රමාණයේ ප්‍රසාරණයන් හා සීමාවන් මත විවිධ දෘෂ්ටිකෝණවලට හසුව ඇති ආකාරයේ ස්වරූපය පූර්ව දැක්වීම්වලින් හඳුනාගත හැකි ය. සිදත්සඟරාව මූලාශ්‍රය වී ගොඩනඟුණ 'නව විග්‍රහාත්මක සිද්ධාන්ත' ලෙස පූර්ව දක්වීම් අර්ථකථනය කළ හැකි හෙයින් ව්‍යාකරණ ප්‍රයෝග විග්‍රහාත්මක ක්‍රමවේදයේ නවීකරණයන් ලෙස ද මේ විචාර ග්‍රන්ථ හඳුන්වා දිය හැකි ය.

ගුණවර්ධනයන් හා කුමාරතුංගයන් මේ අභියෝගාත්මක ගැටලුවට මුහුණ දීම වෙනුවෙන් සිද්ධාන්ත පරීක්ෂණය (1924) හා සිදත්සඟරා විවරණය සම්පාදනය කොට තිබේ. ප්‍රථමයෙන් සිදත්සඟරාවේ අඩුපාඩු පෙන්වා දුන් අතර කුමාරතුංග දෙවනුව සිංහල භාෂාවේ ව්‍යාකරණය සඳහා **සිංහල භාෂාවේ ව්‍යාකරණය** යන කෘතිය රචනා කොට තිබේ (2481). එසේ වුව ද සිංහල භාෂාව ඉගැන්වීමට ව්‍යාකරණ ග්‍රන්ථ බොහෝමයක් විසිවන හා විසි එක්වන සියවස්වල දී රචනා වුව ද සිදත්සඟරාවට ගොඩනැගී තිබූ සමාජ සම්මතය වෙනස් කිරීම හෝ බිඳ හෙළීමට කුමාරතුංගගේ ව්‍යාකරණ විවරණයට මෙන් ම සමකාලීන ග්‍රන්ථවලට නොහැකි වූ අතර ව්‍යාකරණ විවරණය අධ්‍යයන ග්‍රන්ථයක් වශයෙන් නිර්දේශීකරණයට ද හසු නොවී ය. සිදත්සඟරාව පාදක කොටගෙන භාෂා සැලසුම්කරණ න්‍යායාත්මක පසුබිමෙන් කුමාරතුංගගේ මේ නව ප්‍රයත්නය අංශ දෙකකින් වැදගත් වෙයි. ඒ කුමාරතුංගයන් ද අවශ්‍ය ව්‍යාකරණ ඥානය සිදත්සඟරාවෙන් ලබා ගැනීම හා කාලීන අවශ්‍යතා සඳහා ඒ දැනුම උපයෝගී කොටගෙන නව ව්‍යාකරණ ග්‍රන්ථයක් සම්පාදනය කිරීම යි.

සිදත්සඟරා කතුවරයාගේ ආදර්ශයම ගත් විචාර ග්‍රන්ථ කතුවරුන් සිදත්සඟරාව ප්‍රාමාණික නොවන බවත්, සිදත්සඟරාවේ ව්‍යාකරණ රීති සංස්කරණය විය යුතු බවත් දක්වමින් ව්‍යාකරණ කෘතියක් සම්පාදනය කොට තිබේ. සිදත්සඟරාවට මෙන් ම සිදත්සඟරාව බැහැර කොට නව කෘතියක් සැකසීමට ප්‍රතිපක්ෂ මතයක් ද ගොඩනැගී තිබුණ ද විචාර ග්‍රන්ථ කතුවරුන් කාලීන අවශ්‍යතා සඳහා ව්‍යාකරණ ප්‍රයෝග සකසා ගැනීමත්, ව්‍යාකරණ ග්‍රන්ථ සම්පාදනය කිරීමේ සිදත්සඟරා කතුවරයාගේ නිර්දේශය ම සම්මතකරණය කළේ ආදර්ශයෙනි. සිංහල භාෂාවේ ව්‍යාකරණය ග්‍රන්ථය එහි ප්‍රතිඵලයකි.

දහඅට වන සියවසේ සිට සිදත්සඟරාව පාදකව බිහිව ඇති ව්‍යාකරණ කෘතිවල ස්වරූප කිහිපයකි. සංස්කරණ, පෙළ සහිත සන්න, පෙළ සන්න සහිත විස්තර ග්‍රන්ථ, පෙළ සන්න සහිත විචාර ග්‍රන්ථ හා විචාර කෘති යි. සන්න, සන්න සහිත විස්තර කෘතිවලින් සිදත්සඟරා ව්‍යාකරණ ප්‍රයෝග සම්මතකරණය වූ අතර විස්තර ග්‍රන්ථවලින් සිදත්සඟරා ව්‍යාකරණ ප්‍රයෝග පැහැදිලි කිරීම හා මාතෘ හා ජේක ප්‍රයෝග හා ව්‍යවහාරාශ්‍රයෙන් සිදත්සඟරා ව්‍යාකරණ ප්‍රයෝග තහවුරු කිරීම වැනි කරුණු මුල්කරගෙන සම්මතකරණයට ප්‍රබල මෙන් ම ප්‍රභූත්ව අධිකාරීත්වයක් ගොඩනැගිණි (De Alwis" 1851; සිව්‍යාසිස, 1884; සිවිස, 1902; සිභාස, 1929; සසසි, 1955). නමුත් විචාර ග්‍රන්ථවලින් ඒ බලය යම් සීමාවකට හසු කළේ යැයි සැලකිය හැකි වන්නේ ව්‍යාකරණ රීති ඉගෙන ගැනීමේ 'නිර්දේශිත කෘතිය' යන සම්මතයෙන් පසු කාලයේ දී සිදත්සඟරාව බැහැර වීම මුල්කරගෙන යි.

JOURNAL OF THE FACULTY OF HUMANITIES

## 5. නිගමනය

විචාර ග්‍රන්ථ අතර සිද්ධාන්ත පරීක්ෂණය (1924), සිදත්සඟරා විවරණය (2508), සිදත්සඟරා අරුත් වියකන (1967), සිදත් සඟරා විචාරය සහ සරසවි ව්‍යාකරණය (1966), සිදත් සඟරා විමසුම (2004) කැපී පෙනෙන්නේ සිදත්සඟරා ඌනතා මතු කොට දක්වා ඇති ග්‍රන්ථ වශයෙනි. පූර්ව කෘති මෙන් ම සිදත්සඟරා විනිස (1924), ව්‍යාඛ්‍යාන සහිත සිදත් සඟරාව (1998) වැනි කෘතිවලින් පෙනී යන්නේ සිදත්සඟරා ව්‍යාකරණ ප්‍රයෝග විවේචනාත්මක ස්වරූපයෙන් අඩුපාඩු දැක්වුවත් සිදත්සඟරා ව්‍යාකරණ රීති පිළිගෙන ඇති බවකි. එබැවින් සිදත්සඟරා ව්‍යාකරණ රීති පිළිගත් හා නොපිළිගත් වශයෙන් දෙපිරිසක් ප්‍රභූ සමාජයේ සිටි බව පෙනේ. පූර්ව කෘති අතුරෙන් සිදත්සඟරාවේ ව්‍යාකරණ ප්‍රයෝග ප්‍රබල විවේචනයකට හසුව ඇත්තේ සිදත්සඟරා විවරණය (2508) හා සිදත් සඟරා අරුත් වියකන (1967) කෘති දෙකෙනි. වියත් මතයෙන් සිදත්සඟරාවට ගොඩනැගුණ අභියෝගයක් වශයෙන් ද, භාෂා සැලසුම්කරණ න්‍යායට අනුව සිදත්සඟරාව ආශ්‍රයෙන් සිදු වූ නවීකරණයක් ලෙස ද එය සැලකිය හැකි ය. කාලීන වුවමනාවන්ට උචිත ව්‍යාකරණ ග්‍රන්ථයක් සේ නව ආකෘතියකින් සිංහල භාෂාවේ ව්‍යාකරණ රීති ගොඩනැගූ කුමාරතුංගයන්ගේ ව්‍යාකරණ විවරණය (1935) සිදත්සඟරාව මෙන් ප්‍රභූ වියත් නිර්දේශීකරණයෙන් එකල සමාජ සම්මතකරණයට හසු නොවුයේත්, ව්‍යාකරණ රීති ඉගැන්වීමේ නිර්දේශිත කෘතිය බවට පත්නොවුයේත් මේ අවදිය වන විට සිදත්සඟරා ව්‍යාකරණ ප්‍රයෝග පිළිගත් වියත්, සමාජ පිරිස බහුතර වීමත්, ඒ වන විට සිදත්සඟරාව කෙරෙහි සමාජයේ ගොඩ නැගී තිබූ බලය, ප්‍රභූත්ව අධිකාරිය හා ආකල්පත්, කුමාරතුංගයන්ගේ සිදත්සඟරා විවරණයෙන් සිදත්සඟරා ව්‍යාකරණ ප්‍රයෝග දැඩි ස්වරූපයකින් විවේචනයට හසු කිරීමත් වැනි කරුණු මුල්කරගෙන විය යුතු ය. ගුණවර්ධනගේ සිද්ධාන්ත පරීක්ෂණය (1924) හා කුමාරතුංගගේ සිදත්සඟරා විවරණය (1935) සිදත්සඟරාවේ ඌනතා පෙන්වමින් ගොඩ නැගූ විවේචනාත්මක ආකෘතිය පසුකාලීක සම්ප්‍රදායක් ගොඩනැගීමට සමත් වුව ද කාලීන වශයෙන් ප්‍රබල සමාජ මෙහෙවරක් කිරීමට උපස්තම්භක නොවීමට හේතු වී යැයි සැලකිය හැකි කරුණු කිහිපයකි. කාලීන වියත් මෙන් ම පොදු ජන බහුතරයෙන් සිදත්සඟරා ව්‍යාකරණ ප්‍රයෝග සම්මතකරණය ප්‍රබල වීම, ගුණවර්ධන, සිංහල භාෂාවේ මව් භාෂාව දෙමළ භාෂාව ලෙස නිර්දේශීකරණය, කුමාරතුංග සිදත්සඟරා විවරණයේ දී (2508) සිදත්සඟරා ව්‍යාකරණ ප්‍රයෝග විවේචනයට හසු කරන ආකාරය ඒ අතර ප්‍රධාන වෙයි.

මේ නිසා සිදත්සඟරාව සම්භාව්‍යත්වයේ පමණකුදු නොව සිංහල භාෂාවේ ව්‍යාකරණ ඉගැන්වීමේ කෘතිය යන සම්මතය තව දුරටත් ආරක්ෂා වීමට හේතු වුව ද ගුණවර්ධනයන් මෙන් ම කුමාරතුංගයන් ගොඩනැගූ සිදත්සඟරා ව්‍යාකරණ ප්‍රයෝග විවේචනය කිරීමේ සම්ප්‍රදාය දීර්ඝ කාලීනව සිදුවිය. විසි එක්වන සියවසේ බිහිව ඇති සිදත්සඟරා විමසුම (2004; දෙවන මුද්‍රණය, 2008) දැනට බිහිව ඇති අවසාන කෘතිය යි. මේ සිදත්සඟරා විවේචනාත්මක සම්ප්‍රදායෙන් සිදු වූ ප්‍රබල භාෂා සැලසුම් ක්‍රියාවලියක් වන්නේ කාලීන වුවමනාවන් සඳහා නව ව්‍යාකරණ ග්‍රන්ථයක අවශ්‍යතාව හෙළිදරව් කිරීමත්, අධ්‍යාපන ක්‍රියාවලියේ දී ව්‍යාකරණ රීති ඉගැන්වීමේ ක්‍රමවේදය වෙනස් විය යුතු බව පෙන්වා දීමත්, වර්තමානය වන විට නව අධ්‍යාපන ක්‍රම වේදයක් ක්‍රියාවට නැගීමත් ය. ඒ අතර සිදත්සඟරා විචාර ග්‍රන්ථවලින් සිදත්සඟරාවේ බොහෝ ව්‍යාකරණ රීති නිර්දේශීකරණයෙන් සම්මතකරණයට හසුකොට තිබේ.

JOURNAL OF THE FACULTY OF HUMANITIES 32

නමුත් සිදත්සඟරාවේ ව්‍යාකරණ ප්‍රයෝගවල ඌනතා කැපී පෙනෙන්නේ නිවැරදි ප්‍රයෝග තත්කෘති අවධාරණය කොට නොමැති හෙයිනි. ඇතැම් ව්‍යාකරණ ප්‍රයෝග සංස්කරණය විය යුතු ආකාරය, ඒ ව්‍යාකරණ ප්‍රයෝග විකල්ප ප්‍රයෝග ඇසුරින් නවීකරණයට හසුවිය යුතු අයුරු පෙන්වා දී තිබීම ද ඒ අතර කැපී පෙනෙයි. සන්න මෙන් ම විචාර ග්‍රන්ථවලින් සිදත්සඟරාව මුල්කොටගෙන විවිධ අඩුපාඩු දක්වා තිබුණ ද මේ සෑම ග්‍රන්ථයකින්ම ඡේක ප්‍රයෝග, ව්‍යවහාරය ඇසුරෙන් භාෂාවේ පාරිශුද්ධතාව ආරක්ෂා කරගැනීමේ වැදගත්කම ද පෙන්වා දී ඇත. විචාර ග්‍රන්ථවල පොදු දුර්වලතාවක් වන්නේ වියත් අදහස්වල සමානත්වයක්, ඌනතා හෝ නිවැරදිතා පිළිබඳ පොදු පිළිගැනීමක් නොවීම ය. ඇතැම් වියතුන් සාවද්‍ය යැයි පෙන්වා දී ඇති ව්‍යාකරණ රීති තවත් පිරිසක් නිවැරදි යැයි දක්වා තිබේ. නූනයේ වුව ද සිදත්සඟරාවේ ව්‍යාකරණ ප්‍රයෝග පිළිගන්නා මෙන් ම බැහැර කරන සමාජ කණ්ඩායම් දෙකක් හඳුනාගත හැකි ය. කෙසේ වුව ද විචාර ග්‍රන්ථ කර්තෘන් අතර පිළිගත් සම්මතයක් නොවීමත් සිදත්සඟරා ව්‍යාකරණ ප්‍රයෝග නූතනය තෙක් සම්මකකරණයේ පැවැතීමත් නව ව්‍යාකරණ ග්‍රන්ථවල මූලාශ්‍රය කෘතිය බවට සිදත්සඟරාව පත්වීමට හේතු වන්නට ඇත. මේ නිසා ම වර්තමානය තෙක්ම දීර්ඝ කාලයක් 'සම්භාව්‍ය ව්‍යාකරණ කෘතිය' වශයෙන් සමාජ සම්මතයෙන් ගෞරවයට පාත්‍ර ව ඇත්තේ සිදත්සඟරාව යි.

සිදත්සඟරා කතුවරයා ප්‍රකට කළ ව්‍යාකරණ සංස්ථිතියේ රීති සම්මතකරණය, ඌනතා විචාරාත්මක ව විග්‍රහයට හසු කිරීම හා දුර්වලතා සම්පූර්ණ කළ යුතු ආකාරය පෙන්වා දීම විචාර ග්‍රන්ථවල මූලික අභිප්‍රායක් වී ඇති බැව් පෙනේ. එසේ වුව ද භාෂා සැලසුම් ක්‍රියාවලියේ සංහිතා සැලසුම වෛෂයික මේ විචාර ග්‍රන්ථ අධ්‍යයනයේ දී සිදත්සඟරාවේ ව්‍යාකරණ සංස්ථිතිය පාදක ව භාෂාවක ව්‍යාකරණ ව්‍යුහය, ප්‍රයෝග හා සම්බන්ධ වැදගත් කරුණු කිහිපයක් හෙළිදරව් කළ හැකි ය. **ඒ සිංහල භාෂාවේ ව්‍යාකරණ ව්‍යූහයේ පොදු සැලැස්ම සම්මතකරණය වීම, මූලික ව්‍යාකරණ සංකල්ප හා බැඳුණු උපසංකල්ප ප්‍රකට වීම, ප්‍රධාන සිද්ධාන්ත, උප සිද්ධාන්ත හා බැඳුණු ව්‍යාකරණ ලක්ෂණ ප්‍රකට වීම හා ව්‍යාකරණ ප්‍රයෝග භාෂා පරිණාමීය ලක්ෂණ හා වෙනස් වුව ද ප්‍රධාන සිද්ධාන්ත නිර්දේශිතය දීර්ඝ කාලීන වීම යි. තවත් වැදගත් කරුණක් වන්නේ නව ව්‍යාකරණ ග්‍රන්ථ සම්පාදනයට පසුබිමක් නිර්මාණය වීම යි.**

JOURNAL OF THE FACULTY OF HUMANITIES 32

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අදිකාරි, ඒ., (1996). *'සිංහල භාෂාවේ සම්භාව්‍ය ව්‍යාකරණ ග්‍රන්ථය' සම්භාෂා.* කලාපය - 7. ඉසුරුපා. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන දෙපාර්තමේන්තුව.

අබේකෝන් ඒ. එම්. ලොකුබණ්ඩාර., (2001). *සිංහල ව්‍යාකරණ සමීක්ෂා.* (සිදත්සඟරාව ආශ්‍රිතව). මහනුවර. ග්‍රැපික් ලෑන්ඩ්.

අභයසිංහ, ඒ.ඒ., (1998). *ව්‍යාඛ්‍යාන සහිත සිදත් සඟරාව.* කඩවත. අභය මුද්‍රණ ශිල්පියෝ සහ ප්‍රකාශකයෝ.

අය්යර්, ජී. (වර්ෂය නැත). (සංස්.) *වීරසෝළියම් දෙමළ වියරණය (පෙරුම්තෙවනාර් පදාර්ථය සහිත).* සිංහල පරිවර්තන ඇම්. එච්. පීටර් සිල්වා. (වර්ෂය නැත). බත්තරමුල්ල, ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය.

ඒකනායක, පි., (1996). *'සිංහලයේ දේශීය අනන්‍යතාව ප්‍රකට කරන වර්ණමාලාව'* සම්භාෂා. 7 කලාපය. බත්තරමුල්ල. පිරිවෙන් ශාඛාව. 137.

කරුණාතිලක, ඩබ්ලිව්.එස්., (2006). *සිංහල භාෂා ව්‍යාකරණය.* කොළඹ. ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

කුමාරණතුංග, මුනිදාස. සහ ගුණවඩු, ඒ., (2508). *සිදත් සඟරා විවරණය.* කොළඹ. අනුල පහරුවෙහි.

කුලසූරිය, ඒ., (1961). *සිංහල සාහිත්‍ය 1.* මහරගම. සමන් මුද්‍රණාලය.

කෝපරහේවා, සඳගෝමී., (2010). *විසි වන සියවසේ සිංහල භාෂා ව්‍යවහාරය. සමාජවාග්විද්‍යාත්මක අධ්‍යයනයක්.* කොළඹ. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ගම්ලත්, එස්., (1998). *සම්භාව්‍ය සිංහල කව්‍යයේ විකාශනය.* කොළඹ. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ගයිගර්, ඩබ්., (1937). *සිංහල භාෂාවේ ව්‍යාකරණය. (A Grammar of the Sinhala Language)'*–සිංහල පරිවර්තනය - (1964), (නැවත මුද්‍රණය 2005). අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

ගයිගර්, ඩබ්., (2001). *සිංහලයේ වාග්විද්‍යාත්මක ස්වරූපය. (The Linguistic Character of Sinhalese* නිබන්ධයේ සිංහල පරිවර්තනය). පරි. විමල් ජී. බලගල්ලේ. බොරලැස්ගමුව, විසිදුනු ප්‍රකාශකයෝ.

ගුණරත්න, එල්., (වර්ෂය නැත). (සංස්.). *සිදත් සඟරා සරල සන්නය.* කොළඹ. රත්න පොත් ප්‍රකාශකයෝ.

ගුණවර්ධන, ඩබ්ලිව්.එෆ්., (1924). *සිද්ධාන්ත පරීක්ෂණය හෙවත් ස්වභාෂා නීතිසාරය.* එන්. ජේ. කුරේ. (දෙවන මුද්‍රණය - 1959). කොළඹ, එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම.

ගුණවර්ධන, ඩබ්ලිව්.එෆ්. (1973). *සිංහල වාග්විද්‍යා මූලධර්ම.* (සංශෝධනය හා පරිවර්තනය ඇම්.එච්.ඇෆ්ජ්. ජයසූරිය සහ මාපලගම සඞ්ඝානන්ද). කොළඹ, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

ගොඩකුඹුරේ, සී., (1971). *ශාස්ත්‍රීය ලිපි හා කථා.* කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

ජයතිලක, කේ., (1991). *නූතන සිංහල ව්‍යාකරණයේ මුල් පොත.* (දෙවන මුද්‍රණය - 1993). කොළඹ. ප්‍රදීප ප්‍රකාශකයෝ.

ජයතිලක, කේ. (1992). *විමර්ශන සහිත සිදත්සඟරාව.* (05 වැනි මුද්‍රණය - 2009). කොළඹ. ප්‍රදීප ප්‍රකාශකයෝ.

ජයතිලක, ඩී.බී., (1902). *සංඥාපනය. සිදත්සඟරා විස්තර සන්නය. (ශෝධක) රත්මලානේ ධර්මාරාම.* කොළඹ. සත්‍ය සමුච්චය යන්ත්‍රාලය.


JOURNAL OF THE FACULTY OF HUMANITIES 32

ජාතික අධ්‍යාපන ආයතනය., (1989). *සිංහල ලේඛන රීතිය.* මහරගම. ජාතික අධ්‍යාපන ආයතනය.

ඤාණානන්ද, එම්., (1940). *සිංහළ භාෂා ඉතිහාසය.* (තෘතීය මුද්‍රණය - 1963). කොළඹ. ස්වස්තික මුද්‍රණාලය.

ඤාණාලොක, කේ., (1962-1963). *'සිදත් ගැට තුනක්' සිංහල සඟරාව. 3 කලාපය.*

ඤාණාලොක, කේ., (1972). *සිදත්සඟරා පුරාණ සන්නය.* කොළඹ. අනුල මුද්‍රණාලය.

ඩයස්, ඩී. පී. ඊ., (1993). *සිදත් සඟරා විචාර විමංසා.* දෙහිවල. ශ්‍රීදේවී ප්‍රින්ටර්ස් (ප්‍රයිවේට්) ලිමිටඩ්.

තෙන්නකෝන්, ර., (1954). *සිදත්සඟරාව අරුත් වියකන* (චතුර්ථ මුද්‍රණය, 1967). කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

ද සිල්වා, ම.ව.එස්., (1963). *භාෂා විමර්ශනය.* මහරගම. සමන් ප්‍රකාශකයෝ.

ද සිල්වා, ම.ව.එස්., (1963). *විග්‍රහාත්මක වාග්විද්‍යාව.* කොළඹ. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව.

ද සිල්වා, ම.ව.එස්., (1965). *'Some Observation on the Scope of the Sidat Sañgarāwa - Paranavithana Felicitation Vollume'* ග්‍රන්ථයට සැපයූ ලිපියේ සිංහල අනුවාදය (2002). මැදගම පඤ්ඤාලෝක. *සම්භාෂා. 12 වැනි කලාපය.* ඉසුරුපාය. අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාව.

ද සිල්වා., (1969). *සිංහලභාෂාවේ ප්‍රශස්ත ව්‍යාකරණ ග්‍රන්ථයක් - සිදත් සඟරාව,* ලංකාවේ අධ්‍යාපනය 1. සියවස ප්‍රකාශනය, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය.

දිවාකර, අනුරින්, ඉන්දිකා., (2017). *සිදත්සඟරාවේ භාෂා සැලසුම්කරණ.* කොළඹ. සමයවර්ධන ප්‍රකාශකයෝ.

දිවාකර, අනුරින්, ඉන්දිකා., (2017). *සිදත්සඟරාව; පසුකාලීන භාෂා සැලසුම්කරණ.* කොළඹ. සමයවර්ධන ප්‍රකාශකයෝ.

දිසානායක, ජේ.බී., (1969). *භාෂාවක රටා සමුදාය.* කොළඹ. ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්ස් සමාගම.

දිසානායක, ජේ.බී., (1970). *භාෂාවක භාවිතය හා විග්‍රහය.* කොළඹ. ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්ස් සමාගම. (නවතම මුද්‍රණය - 2003). සීමාසහිත ස්ටැම්ෆර්ඩ් ලේක් (පෞද්ගලික).

දිසානායක, ජේ.බී., (1973). *සමකාලීන සිංහලයː ශබ්ද විචාරය.* කොළඹ, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ කොළඹ මණ්ඩපය.

දිසානායක, ජේ.බී., (1990). *නූතන සිංහල ලේඛන ව්‍යාකරණයː 1 - අක්ෂර වින්‍යාසය.* කොළඹ. ලේක් හවුස් ඉන්වෙස්ට්මන්ට්ස් සමාගම.

දිසානායක, ජේ.බී., (1995). *සමකාලීන සිංහල ලේඛන ව්‍යාකරණයː 1 - ව්‍යාකරණ ප්‍රවේශය.* (2 වන මුද්‍රණය - 2005. කොළඹ. එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

දිසානායක, ජේ.බී., (1997). *සමකාලීන සිංහල ලේඛන ව්‍යාකරණයː 3 - සන්ධි විග්‍රහය.* කොළඹ. එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

දිසානායක, ජේ.බී., (2000). *සිංහල හෝඩිය.* (දෙවන මුද්‍රණය - 2003). කොළඹ. එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

දිසානායක, ජේ. බී., (2001). *ක්‍රියා පදය. බසක මහිමː 11.* කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

දිසානායක, ජේ.බී., (2005). *මානව භාෂා ප්‍රවේශය.* කළුබෝවිල. සුමිත ප්‍රකාශකයෝ.

JOURNAL OF THE FACULTY OF HUMANITIES-32

දිසානායක, ජේ.බී., (2006). *සිංහල අක්ෂර විචාරය.* කළුබෝවිල. සුමිත ප්‍රකාශකයෝ.

ධම්ම පරායනතිස්ස හිමි, ඤාණිස්සර හිමි, බුජ්ජම්පොල., සහ ආනන්ද, ඒ., (1966). *සිදත් සඟරා විචාරය සහ සරසවි වියරණය.* වෙන්නප්පුව, පීරිස් මුද්‍රණාලය.

ධම්මරතන හිමි, එච්., (1963). *සිංහලයේ ද්‍රවිඩ බලපෑම*, කොළඹ. අනුල මුද්‍රණාලය.

ධර්මදාස, කේ.එන්.ඕ., (1993). *'ස්වභාෂාව හා අධිකරණය' භාෂා සාහිත්‍ය සහ සංස්කෘතික විමර්ශන.* විජයරත්න සම්භාවනා. කොළඹ, සංස්කෘතික අමාත්‍යාංශය.

ධර්මදාස, කේ.එන්.ඕ., (1994). *'භාෂාවෙහි අභියෝගය' චින්තක. ශාස්ත්‍රීය සංග්‍රහය. දහවන කලාපය.* කැලණිය, කැලණිය විශ්වවිද්‍යාලයීය මහා ශිෂ්‍ය සංගමය.

ධර්මානන්ද., (1924). ඊ.ඩී.සී. ප්‍රඥාසෙන. *සිදත්සඟරා විනිස නොහොත් සිද්ධාන්ත පරීක්ෂණයට පිළිතුරු.* ඊ. ඩී.රොබට් අප්පුහාමි. විද්‍යාර්ථ ප්‍රකාශන යන්ත්‍රාලය.

ධර්මාරාම හිමි, ආර්., (1902). *සිදත්සඟරා විස්තර සන්නය.* (සත්වන මුද්‍රණය). කැලණිය. විද්‍යාලංකාර පිරිවෙන.

පඤ්ඤාසාර හිමි, ඔ., (2004). *සිදත්සඟරා විමසුම.* කොළඹ, S & S මුද්‍රණාලය.

පරණවිතාන, එස්., (සංස්.) (මුල් පිටු නැත). *'සිදත්සඟරා කතුවරයා'. පියවර*

පරණවිතාන, එස්., (1961). *'ප්‍රාකෘත සිංහලය ලිවීමට ගත යුතුයි' (සංස්). තුළ. අශෝක කරුණාරත්න, විශාඛා ගුණතිලක. නූතන සිංහල ගද්‍ය සාහිත්‍යය.* කොළඹ.

පෙරේරා, ජේ.(සංස්.)., (1865). *සිදත් සඟරා.* කොළඹ. වෙස්ලියන් මිෂන් මුද්‍රණාලය.

පෙරේරා, ජේ., (1876). (සංස්). *සිදත්සඟරා ලියන සන්නය.* කොළඹ. ශාස්ත්‍රාලෝක යන්ත්‍ර සාලාව.

පෙරේරා, ටී.ජී., (1932). *සිංහල භාෂාව.* කොළඹ. ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

පෙරේරා, අයි.ජී., (1960). *සිංහල භාෂා සාහිත්‍ය විචාරය.* ගල්කිස්ස. අභය ප්‍රකාශකයෝ.

පේමානන්ද, පී., (2004). *සිංහල භාෂාවේ පරිණාමය හා සිදත් සඟරාව.* කොළඹ. එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ප්‍රඥාසේන, ඊ.ඩී.සී, (1924). *සිදත් සඟරා විනිස නොහොත් සිද්ධාන්ත පරීක්ෂණයට පිළිතුරු.* ඊ.ඩී. රොබර්ට් අප්පුහාමි. විද්‍යාර්ථ ප්‍රකාශ යන්ත්‍රාලය.

ප්‍රේමරත්න, ඒ.සී., (2001).*'නව සියවසට නව වියරණයක්'* සාරස - ශාස්ත්‍රීය සංග්‍රහය. කොළඹ. එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

බලගල්ලේ, විමල් ජී., (1983). *සිංහලයේ සඤ්ඤක අකුරු. සංස්කෘති: හෙට්ටිආරච්චි විශේෂ කලාපය.* කොළඹ. සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය.

බලගල්ලේ, ඩබ්.ජී., (1992). *සිංහල භාෂාවේ සම්භවය හා පරිණාමය.* කොළඹ. එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

බලගල්ලේ, ඩබ්.ජී., (1996). *සිංහල භාෂාවේ ප්‍රභවය හා ප්‍රවර්ධනය.* කොළඹ. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

බලගල්ලේ, ඩබ්.ජී., (1998). *සිංහල භාෂාධ්‍යයන ඉතිහාසය.* කොළඹ. එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

බලගල්ලේ, ඩබ්.ජී., (2004). *කුමාරතුංග මුනිදාස ශාබ්දිකයකු ලෙස.* විසිදුනු විමැසුම - 1. සුවහස් නය මනැසි ඉසිවරයාණෝ. බොරලැස්ගමුව. විසිදුනු ප්‍රකාශකයෝ.

රතනසාර හිමි, කහවේ ශ්‍රී සුමංගල., (1929). (සංස්කරණය). *විස්තර ගැටපද විවරණ සහිත සිදත්සඟරා භාවසන්නය.* කොළඹ. මහාබොධි යන්ත්‍රාලය.


JOURNAL OF THE FACULTY OF HUMANITIES 32

රාය, හේමචන්ද්‍ර. (සංස්.)., (1972). *ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය.* කැලණිය. (විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ සිංහල පරිවර්තනය). විද්‍යාලංකාර විශ්වවිද්‍යාල මුද්‍රණාලය.

වික්‍රමසිංහ, කේ.ඩී.පී., (1961). *සිංහල ලේඛක පරපුර.* (2 සංස්කරණය, 1964). කොළඹ. ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

වික්‍රමසිංහ, එම්., (1932). *සිංහල සාහිත්‍යෝදය කථා සහ සාහිත්‍ය කලාව.* (8 මුද්‍රණය -1991). දෙහිවල. තිසර ප්‍රකාශකයෝ.

විජයසූරිය, ඩබ්ලිව්., (2002). *ඓතිහාසික වාග්විද්‍යාවෙන් සිදතට එළියක්.* සම්භාෂා 12 කලාපය. ඉසුරුපාය. පිරිවෙන් අධ්‍යාපන ශාඛාව.

විමලකීර්ති හිමි, එම්., (1965). *සිංහල භාෂාවේ ඉතිහාසය.* කොළඹ. ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

සන්නස්ගල, පී., (1961). *සිංහල සාහිත්‍ය වංශය.* (නව සංස්කරණය, 1994). කොළඹ. ලේක්හවුස් මුද්‍රණාලය.

සාසනතිලක හිමි, එම්., (1960). *වාග් විද්‍යාව.* කොළඹ. ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

සිද්ධාර්ථ හිමි, ත., (1955). *සරල සන්න සහිත සිදත් සඟරාව.* එච්. සෙල්ලාහේවා.

සිරි සුමංගල හිමි, එච්., (2476). *සිංහල ව්‍යාකරණ පරීක්ෂණය.* වේයන්ගොඩ. වේයන්ගොඩ මුද්‍රණාලය.

සිරි සොමිස්සර හිමි, එම්., (1965). *සිදත් සඟරා විමසුම.* (ද්විතීය මුද්‍රණය - 1996). කොළඹ. සමයවර්ධන පොත්හල.

සිල්වා, එම්.එච්.පීටර්., (1969). *'සිංහල භාෂාවේ ප්‍රශස්ත ව්‍යාකරණ ග්‍රන්ථයක් - සිදත් සඟරාව'; ලංකාවේ අධ්‍යාපනය 1 (ක්‍රි. පූ. ස වැනි සියවසේ සිට අද දක්වා) 'සියවස' ප්‍රකාශනය.* ලංකාවේ අධ්‍යාපන සහ සංස්කෘතික අමාත්‍යාංශය.

සුගතවංශ හිමි, කේ., (1992). *සන්න සහිත සිදත් සඟරාව.* කොළඹ. එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සුමංගල හිමි, එච්., (1878). *වර්ණරීතිය හා සිංහල ව්‍යාකරණය.* ජී. එච්. පෙරේරා. ලක්රිවිකිරණ මුද්‍රණාලය.

සුමංගල හිමි, එච්., (1884). (සංස්.). *සිංහල ව්‍යාකරණය සිදත් සඟරා සන්නය.* (සවෙනි වරට - 1929). ඩී. ඩබ්ලිව්. සිරිවර්ධනඃ ජිනාලංකාර මුද්‍රණාලය.

සුමංගල හිමි, ඩබ්ලිව්., (1963). *හෙළු වියරණ විනිස.* කොළඹ. අනුල මුද්‍රණාලය.

සුමනජෝති හිමි, පි. සහ පඤ්ඤාලොක හිමි, ඩබ්ලිව්., (1966). *වාග්විද්‍යාත්මක සිංහල ව්‍යාකරණය.* (ද්විතීය මුද්‍රණය - 1999). කොළඹ. එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සුමනජෝති හිමි, ඩි., (2503) *දඹදෙණි යුගය.* II , කාණ්ඩය, වක්කුණුවළ. ශ්‍රී සුගත ග්‍රන්ථාකරය.

සෝරත හිමි, ඩබ්ලිව්. (සංස්)., (1999). *සුමංගල ශබ්ද කෝෂය.* ද්විතිය භාගය. කොළඹ. එස්. ගොඩගේ සහ සහෝදරයෝ.


JOURNAL OF THE FACULTY OF HUMANITIES -32

## References


Anshen, Frank., (2001). 'Language Planning' *The Handbook of Linguistics*. Oxford. Blackwell Publishing Ltd. 704-713.

Bloomfield, Leonard., (1933). *Language*. (Fourteenth Impression - 1979). London. George Allen & Unwin.

Christian, Donna., (1988). 'Language Planning' the view from Linguistics in Frederick, J. Newmeyer. *Language: the Socio-Cultural Context*. Cambridge, Cambridge University Press. 193-211.

Cooper, R. L., (1989). *Language Planning and Social Change*. New York. Cambridge University Press.

De Alwis, J., (1851). *The Sidath Sangarāwa, A Grammar of the Singhalese Language*. Translated into English with Introduction. Notes and Appendices. Ceylon. Government Printer.

De Silva, M.W.S., (1967). Some Observations on the Scope of the Sidat Sangarāva. *Paranavitana Felicitation Volume on Art & Architecture and Oriental Studies*. 67-88.

Dharmadasa, K.N.O., (1972). 'Language and Sinhalese Nationalism: The Career of Munidasa Cumaratunga' *Modern Ceylon Studies*. Vol: 3 (2). 125-143.

Eastman, C., (1983*). Language Planning*; An Introduction. San Francisc Chandler & Sharp Publishers Inc.

Fishman, Joshua, A., (1971). 'The Impact of Nationalism on Language Planning'

Geiger, W., (1908). *Mahavamsa*. London, Oxford University Press.

——— (1925). *Chülavamsa*. (1927 2nd) London. PTS.

——— (1929, 1930). *Cülavamsa*. Vols: I & II. (Reprint - 1970). London: Oxford University Press.

——— (1938). *A Grammar of the Sinhalese Language*. Colombo, The Royal Asiatic Society Ceylon Branch.

Josheph., (1987). Eloquence and Power. *The Rise of Language Standards and Standard Language*. New York, Basil Blackwell.

Joseph, J.E. and Taylor, T.J. (eds)., (1990). *Ideologies of Language*. London: Routledge.

Mesthrie**,** R., (2000). 'Clearing Ground: Basic Issues Concepts and Approaches' in. Mesthrie et al. (2000) pp. 1-43.

Milroy, J. and Milroy, L., (1999). *Authority in Language*. Investigating Standard English (3rd ed.). London: Routledge.

Milroy, J., (2000). 'Historical description and the ideology of the standard language' in Wright, L. (ed.). *The Development of Standard English 1300-1800*. Cambridge, Cambridge University Press. 11-26.

Nahir, M., (1974). 'Language Academics, Language Planning. and the Case of the Hebrew Revival.' Dissertation, University of Pittsburgh.

Nahir, M., (1984). Language Planning Goals. A Classification Language Problems and Language Planning. London, Blackwell.

Schiffman, H.F., (1998). (27). '*Standardization or restandardization, The case for 'Standard' Spoken Tamil. Language in Society.*


JOURNAL OF THE FACULTY OF HUMANITIES-32